**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ), කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලයේ සහය ඇතිව, මුස්ලිම් කාන්තා සංවර්ධන භාරය (Muslim Women Development Trust - MWDT) සමඟ එක්ව 2024 මාර්තු 6 වැනි දින පුත්තලමේදී ප්‍රතිපත්ති සංවාදයක් පවත්වන ලදී. සිවිල් සමාජ ක්‍රියාකාරීන් 50ක්, සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්, කාන්තා සංවර්ධන නිලධාරීන්, පරිවාස නිලධාරීන්, සහ නීති ආධාර කොමිෂන් සභාවට අනුයුක්ත නීති නිලධාරීන්, මනෝ උපදේශකවරුන් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ විවාහ රෙජිස්ට්‍රාර්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් වැනි මේ සඳහා සහභාගී වූ විවිධ පාර්ශවකරුවන්ගේ නිර්දේශ මත පදනම්ව මෙම *ක්‍රියාත්මක වීම සඳහා කැඳවීමේ (Call-to-Action) ලේඛනය* සම්පාදනය කර ඇත.**

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) ඉහත පාර්ශ්වකරුවන් සමඟ එක්ව පහත කරුණු අමතන මෙන් අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටියි;**

**සේවා ලබා ගැනීමේදී ඇතිවන භාෂා බාධකය**

- සියලුම සේවා ආයතනවල බහුභාෂා ආධාරක පද්ධති ක්‍රියාත්මක කිරීම හරහා, විශේෂයෙන්ම ලිංගිකමය සහ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ (SGBV) වින්දිතභාවයෙන් දිවි ගෙවන්නන් සඳහා, පොදු සේවාවන් වෙත ප්‍රවේශ වීමේදී භාෂා ප්‍රවේශය සහතික කිරීම.
- පොලිස් පැමිණිලි සහ නිල වාර්තා බහු භාෂාවලින්, විශේෂයෙන්ම එම පැමිණිල්ල ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමට සහ සිද්ධීන් ලේඛනගත කිරීමට පහසුකම් සැලසීම අරභයා පැමිණිල්ල සිදු කරන ලද භාෂාවෙන්, ලේඛනගත කිරීම වෙනුවෙන් උද්දේශනයන් සිදු කිරීම.
- භාෂා බාධක ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් සහ පුහුණුවක් රාජ්‍ය සේවකයින් හට ලබා දීම සහ පුද්ගලයන් කතා කරන භාෂාව නොසලකා සියලු ප්‍රජා සාමාජිකයින්ට සම ප්‍රවේශය සැපයෙන ආකාරයෙන් සේවා සැපයීම සඳහා ව්‍යාපාරයන්හි නිරත වීම.
- විවිධ භාෂා පසුබිම්වලින් පැමිණෙන රෝගීන් සමඟ ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සඳහා බහුභාෂා උපදෙස් පැවතීම සහතික කිරීම අරභයා සහ කාර්ය මණ්ඩල පුහුණුව සහතික කිරීම අරභයා සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානවල භාෂාවන්ට සංවේදී ආකාරයේ ආධාරක යාන්ත්‍රණ පිහිටුවීම සඳහා කටයුතු සැකසීම.
- වැඩිදියුණු කළ යුතු හිඩැස් සහ ක්ෂේත්‍ර හඳුනා ගැනීම අරභයා භාෂා ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කෙරෙන ආකාරය අධීක්ෂණය කිරීම සහ භාෂා බාධක ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන අඛණ්ඩ උත්සහයන් වෙනුවෙන් උද්දේශනයේ යෙදීම මෙන්ම, සේවාවන් සඳහා සැම දෙනාටම සම ප්‍රවේශය පැවතීම සහතික කිරීම.
- භාෂා ප්‍රවේශය සඳහා තම අයිතිවාසිකම් තහවුරු කිරීමට සහ භාෂාව මත පදනම්ව වෙනස් කොට සැලකීමට හෝ බැහැර කිරීමට ලක් වන අවස්ථාවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ඇතුළුව, පොදු සේවාවන් වෙත ප්‍රවේශ වීමේදී සාධාරණ ලෙස සැලකුම් ලැබීම ඉල්ලා සිටීමට ප්‍රජාවන් බල ගැන්වීම.

**ලිංගිකමය සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) වෙත යොමු කරවන ආකාරයේ පවුල් සහ සමාජ-සංස්කෘතික ගතිකයන්**

- කල්තියා හඳුනාගැනීම සහ මැදිහත්වීම් සිදු කිරීම සඳහා ප්‍රමුඛත්වය දෙමින් දිස්ත්‍රික්කය තුළ තුළ සිදුවන SGBV සහ ළමා අපචාරයන්ට, විශේෂයෙන්ම පියවරුන් විසින් තම දියණියන්ට එරෙහිව සිදුකරන අපයෝජනයන්ට, එරෙහිව සටන් කිරීමේ ප්‍රයත්නයන් වැඩි කිරීම සහ වින්දිතභාවයෙන් දිවි ගෙවන්නන් හට සමාජ අපකීර්තිය සහ සංස්කෘතිය මඟින් නුසුදුසු බවට සිදු කරන ලද අර්ථකතනයන් නොතකා එවැනි අපයෝජනයන් වාර්තා කිරීම සඳහා සවි බල ගැන්වීම සහ ඔවුන් ඒ සඳහා සන්නද්ධ බවට සහතික කිරීම.
- පවුලේ පුරුෂ සාමාජිකයන් නොමැති වීම නිසා උග්‍ර බවට හැරෙන කාන්තාවන්ට පවතින අවදානම් තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීම, සහ සමාජය තුළ මුල් බැස තිබෙන සංස්කෘතික සම්මතයන් හා භාවිතයන් හේතුවෙන් පැන නගින වෙනස් කොට සැලකීම්වලට එරෙහිව සටන් කිරීම.
- ඉලක්කගත ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපන සහ ආධාරක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් විශේෂයෙන් කල්පිටිය වැනි අවදානම් සහිත ප්‍රදේශවල ළමා ගැබ්ගැනීම් හි ව්‍යාප්තිය ආමන්ත්‍රණය කිරීම.
- උපකාරක සේවා සඳහා සහභාගීවීමේදී පිරිමි පුද්ගලයන්ට ඇති බාධක ආමන්ත්‍රණය කිරීම සඳහා බාහිර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ගෘහස්ථ ගැටුම් නිරාකරණය වෙත පිරිමි පුද්ගලයන් වඩා හොඳින් සම්බන්ධ කර ගැනීම සඳහා ඉලක්කගත පියවර ගැනීම.
- අවදානමට ලක්විය හැකි කාන්තාවන්ට සහාය වීම සඳහා මෙවලමක් ලෙස සමාජ මාධ්‍යවල වාසිදායක බව භාවිතා කිරීම. ඒ අතරවාරයේම, ආරක්ෂිත මාර්ගගත අවකාශයන් සහ ඩිජිටල් සාක්ෂරතා සම්පත් ප්‍රවර්ධනය කිරීම හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්, විශේෂයෙන් කාන්තා මූලික නිවාස, සඳහා සමාජ මාධ්‍යවල ද්විත්ව බලපෑම හඳුනා ගැනීම සහ වළක්වා ගැනීම ද සිදු කිරීම.
- නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලින් සහය ලබා ගැනීමට සහ නීතිමය සහය වෙත ප්‍රවේශ වීම සඳහා වින්දිතභාවයෙන් දිවි ගෙවන්නන් සවිබල ගැන්වීම අරභයා වැඩිදියුණු කළ වාර්තාකරණ යාන්ත්‍රණ සහ උපකාරක සේවා වෙනුවෙන් උද්දේශනයේ යෙදීම.
- විශේෂිත උපකාරක සේවා ක්‍රියාත්මක කිරීම හරහා සහ ප්‍රචණ්ඩත්වයට සහ අපයෝජනයන්ට ගොදුරු වීම සඳහා ආබාධ සහිත කාන්තාවන්ට පවතින අවදානම පිළිබඳව දැනුවත් කිරීම මගින් එවන් කාන්තාවන්ගේ ආරක්ෂාව වෙත ප්‍රමුඛත්වය ලබා දීම.
- ඉලක්කගත මැදිහත්වීම් සහ වැළැක්වීමේ උපාය මාර්ග ක්‍රියාවට නැංවීමෙන්, වාර්තා වූ මිනීමැරුම්, ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීම් සහ කාන්තාවන්ට සහ ළමයින්ට එරෙහි ලිංගික අපයෝජන සිද්ධීන් ඇතුළුව පසුගිය වසරේ සංඛ්‍යාලේඛන මගින් පෙන්නුම් කරන ලද පරිදි කාන්තාවන්ට එරෙහිව සිදු කරන ලද භයානක ප්‍රචණ්ඩත්ව අනුපාතයන් ආමන්ත්‍රණය කිරීම.
- දිස්ත්‍රික්කය තුළ මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වීම සහ SGBV සිදුවීම් අතර සහසම්බන්ධය ආමන්ත්‍රණය කිරීම.

**ආර්ථික අභියෝග**

- ආර්ථික අර්බුදයේ ප්‍රතිවිපාක හේතුවෙන් ගැහැණු ළමයින්ට උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති බාධාවන් විසඳීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම, එමගින් අඩු වයසින් විවාහ නොවී උසස් අධ්‍යාපන අපේක්ෂාවන් කරා යාමට ඔවුන් බල ගැන්වීම සිදුවනු ඇත.
- ග්‍රාමීය කාන්තාවන්ට එරෙහිව ක්ෂුද්‍ර ණය සමාගම් විසින් සිදු කරනු ලබන අපයෝජනයන්ට එරෙහිව සටන් කිරීමේ ක්‍රියාමාර්ග වෙනුවෙන් උද්දේශනයේ යෙදීම.

- අපරාධකරුගේ තරාතිරම හෝ සබඳතා නොසලකා, කාන්තාවන් සේවා ස්ථානයේ දී අත්විඳින අපයෝජන සිද්ධීන් වාර්තා කිරීමට සහ ඒවාට විසඳුම් සෙවීමට මාර්ග සලසා දීමෙන් සේවා ස්ථානයේ සිදුවන අපචාර සිදුවීම් ආමන්ත්‍රණය කිරීම.

- ග්‍රාමීය කාන්තාවන් අතර SGBV සිදුවීම් සහ මූල්‍ය යැපීම අතර පවතින සම්බන්ධය හඳුනා ගන්න.

- ආර්ථික අර්බුදය සහ කෝවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස SGBV සිදුවීම්වල සිදු වූ වැඩිවීමට විසඳුම් සෙවීම සඳහා අමතර සම්පත් සහ සහාය වෙන් කිරීම.

**ලිංගිකමය සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) ආමන්ත්‍රණය කිරීමට යාන්ත්‍රණ සහ සම්පත් නොමැතිකම**

- SGBV හා අදාළ නඩු හැසිරවීමට හැකියාව ඇති රජයේ නිලධාරීන්ගේ පවතින හිඟය පියවීම, සැලකිය යුතු සම්පත්වල අවශ්‍යතාවය සපුරාලීම සහ රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යභාරයන් සහ වගකීම් නිශ්චිතව පැහැදිලි කර / හඳුන්වා දීම.

- විමර්ශන විමධ්‍යගත කිරීම සහ කලාපීය සයිබර් අපරාධ ඒකක වෙත සම්පත් සැපයීම මගින් ග්‍රාමීය ප්‍රදේශවල සිදුවන සයිබර් ලිංගිකමය සහ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (Cyber Sexual and Gender-Based Violence - CSGBV) වාර්තා කිරීම සහ ආමන්ත්‍රණය කිරීම සඳහා වූ ක්‍රියාවලීන් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම.

- දීර්ඝ කාලයක් අක්‍රියව තිබූ ප්‍රාදේශීය මට්ටමේ SGBV ජාලය නැවත සක්‍රිය කිරීම. ලිංගික හා ප්‍රජනක සෞඛ්‍යය පිළිබඳ පරිපූර්ණ අධ්‍යාපනය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාව පුරා පාසල්වල පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය (Comprehensive Sexuality Education - CSE) හඳුන්වා දීම සිදු කිරීම.

- සයිබර් ලිංගිකමය සහ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (CSGBV) පිළිබඳ පැමිණිලි ලැබීම සහ විමර්ශනය කිරීම සඳහා ඵලදායී බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

- පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා ශක්තිමත් කිරීම සහ SGBV සම්බන්ධ ගැටලු සඳහා යොමු කෙරෙන ස්ථානයක් ලෙස කටයුතු කිරීම, එම ගැටලු පළාත් පාලන නිලධාරීන් වැනි අදාළ බලධාරීන් වෙත යොමු කිරීම.

- අසාධාරණයකට මුහුණ දෙමින් සිටින විට නීතිමය සහාය ලබා ගැනීම පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීමට සහ බලගැන්වීමට ප්‍රාදේශීය කාන්තා සංවිධාන දිරිමත් කිරීම.

- සෑම පොලිස් ස්ථානයකම SGBV හා අදාළ ගැටලු ඇමතීම සඳහා විශේෂ ලෙස කැපවූ නිලධාරීන් අනුයුක්ත කිරීම වෙනුවෙන් උද්දේශනය කිරීම. මෙම නිලධාරීන් විවිධ ප්‍රජාවන්, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමුන්, සමඟ ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සඳහා සෑම ජාතික භාෂාවක් පිළිබඳවම ප්‍රවීණත්වයක් සහිත අය වනු ඇත.

- SGBV පිළිබඳ රාජ්‍ය නිලධාරීන් අතර දැනුවත්භාවය වැඩි කිරීම සහ SGBV ඵලදායී ලෙස ආමන්ත්‍රණය කිරීමට සහ ඒ වෙත ප්‍රතිචාර දැක්වීමට ඔවුන් වඩාත් හොඳින් සන්නද්ධව සිටින බවට සහතික කිරීම.

- නීති ආධාර කොමිෂන් සභාව, ශ්‍රී ලංකා රතු කුරුස සංවිධානය, ICRC, ග්‍රාම නිලධාරී කොට්ඨාශ වැනි පවත්නා සංවිධාන සහ හවුල්කරුවන් සවිබල ගැන්වීම හරහා හෝ නව හවුල්කරුවන් සහ සංවිධාන පිහිටුවීම හරහා කාන්තාවන් සඳහා ආරක්ෂිත නිවාස සහ අනෙකුත් පහසුකම් පුළුල් කිරීම.

**ලිංගිකමය සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයන් (SGBV) පිළිබඳව සහ ඒවාට එරෙහිව සටන් කිරීමේ ක්‍රම පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම:**

- SGBVට එරෙහිව තමන්ව වඩා හොඳින් ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන්ට හිමි නීතිමය අයිතිවාසිකම් සහ ආරක්ෂාව පිළිබඳව වින්දිතභාවයෙන් දිවි ගෙවන කාන්තාවන් අතර දැනුවත්භාවය ඇති කිරීම.
- නීති ආධාර මධ්‍යස්ථාන හරහා ලබා ගත හැකි නීතිමය පිළියම් පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සහ නීති ආධාර මගින් සපයනු ලබන සේවාවන් පිළිබඳව කාන්තාවන් දැනුවත් කිරීමට පාර්ශවකරුවන් දිරිමත් කිරීම.
- නීති ආධාර කොමිෂන් සභාව තුළ නීති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම මෙන්ම ඒවා බලාත්මක කිරීමට නියම කිරීම.
- ජාතික සහ ජාත්‍යන්තර අලෙවිකරණ ශිල්පීය ක්‍රම කෙරෙහි අවධානය යොමු කරමින්, සමුපකාර සමිති හරහා SGBVහි වින්දිතභාවයට පත් වූ කාන්තාවන් සඳහා ව්‍යවසායකත්ව කුසලතා පුහුණුව ලබා දීම.
- ප්‍රජා සාකච්ඡා සහ ආධාර වැඩසටහන් භාවිතයෙන් කාන්තාවන්ට එරෙහි SGBV සිදුවීම් වැළැක්වීම සඳහා මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දෙන පිරිමි පුද්ගලයන් හට සහාය වීම.
- කාන්තාවන් සහ ගැහැණු ළමයින්ගේ ප්‍රජාවන්ව, තම ප්‍රජාවන් සංවිධානය කර ගැනීමට සහ පවතින උපකාරක සේවා පිළිබඳව දැනුවත් වීමට බලමුලු ගැන්වීම.
- පුත්තලම දිස්ත්‍රික්කයේ සිටින SGBVහි වින්දිතභාවයට පත් වූවන් සඳහා ස්ථිර ආරක්ෂිත නිවාස පිහිටුවීම සඳහා රජයේ ආයෝජනය වැඩි කිරීම වෙනුවෙන් උද්දේශනයෙහි යෙදීම.
- කාන්තාවන් සහ ළමුන්ට එරෙහිව සිදුවන SGBV සිද්ධීන් ආමන්ත්‍රණය කිරීම අරභයා රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා නිසි සම්බන්ධීකරණයෙන් යුත් වේදිකාවක් ස්ථාපිත කිරීම.
- ස්වයං-උපකාරක කණ්ඩායම් හරහා කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ඉඩ සැකසීම, සහ SGBV සිද්ධීන් වාර්තා කිරීම සඳහා විකල්ප මාර්ග සලසා දීම මෙන්ම SGBV සිද්ධීන් රාජ්‍ය බලධාරීන් වෙත වාර්තා කිරීමට කාන්තාවන් මැලිවන බැවින් ඒ සඳහා සහය ලබා ගැනීම.